# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2366/33 - 2024 ජනවාරි මස 12 වැනි සිකුරාදා - 2024.01.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමන) පනත**

2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමන) පනතේ 3 වන වගන්තිය සමඟ කියවිය යුතු 4 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මා විසින් මෙම නියමය මගින් 2022 අගෝස්තු මස 31 දිනැති අංක 2295/10 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද අංක 2022/1 දරන කැසිනෝ ව්‍යාපාර බලපත්‍ර ලබාදීමේ රෙගුලාසිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

(1) රෙගුලාසි අංක 5 අවලංගු කිරීම සහ පහත සඳහන් රෙගුලාසි ආදේශ කිරීම මගින් :-

"5. (1) අවුරුදු විස්සක් (20) හෝ එහි යම් කොටසක් වන කාලයක් සඳහා, බලපත්‍රයක් හෝ බලපත්‍රයක් අලුත් කිරීම සඳහා බලපත්‍ර ගාස්තුව මෙම රෙගුලාසියේ II වන උපලේඛනයෙහි දක්වා ඇති පරිදි විය යුතු ය;

(2) මෙම රෙගුලාසියේ (I) ඡේදයේ දක්වා ඇති කාලසීමාවට වඩා අඩු කාලයක් සඳහා ලබා දී ඇති ඕනෑම බලපත්‍රයක්, එම බලපත්‍රය ලබා දී ඇති කාලසීමාව ඉකුත් වූ පසු, II වන උපලේඛනයේ දක්වා ඇති පරිදි බලපත්‍ර ගාස්තුව ගෙවා අලුත් කළ යුතු ය;

(3) II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති සියලුම බලපත්‍ර ගාස්තු, 2024 ජනවාරි 01 දින සිට වසර පහක කාල පරාසයන් තුළ දැනට පවතින ගාස්තුවෙන් 20% ක උපරිමයකට යටත්ව, අමාත්‍යවරයාට සංශෝධනය කළ හැක;

(4) බලපත්‍රයක් නිකුත් කරනු ලබන්නේ බලපත්‍රයක් සඳහා හෝ බලපත්‍රයක් අලුත් කිරීම සඳහා අයදුම්කරු විසින් ගෙවනු ලබන අදාළ බලපත්‍ර ගාස්තුව පෙර ගෙවූ බවට සාක්ෂි අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ පසු පමණි; "

(2) I වන උපලේඛනය අවසන් වූ වහාම මෙහි සඳහන් උපලේඛනය, II වන උපලේඛනය ලෙස එකතු කිරීම මගින් ;

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2024 ජනවාරි මස 12 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.


1A - PG 6625 — 404 (2024/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

" II වන උපලේඛනය

| | *බලපත්‍රයේ ස්වභාවය හෝ අදාළවන නිර්ණායකය* | *කැසිනෝ බලපත්‍ර ගාස්තු* | *කැසිනෝ බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු* |
|---|---|---|---|
| 1 | ඒකාබද්ධ සංවර්ධනය සඳහා අවම වශයෙන් එක්සත් ජනපද ඩොලර් මිලියන දෙසිය පනහක් ආයෝජනය කරන අයදුම්කරුවන් | රුපියල් බිලියන දහයක් | රුපියල් බිලියන දහයක් |
| 2 | ඒකාබද්ධ සංවර්ධනය සඳහා අවම වශයෙන් එක්සත් ජනපද ඩොලර් මිලියන පන්සියයක් ආයෝජනය කරන අයදුම්කරුවන් | රුපියල් බිලියන පහක් | රුපියල් බිලියන දහයක් |
| 3 | 2023 ජනවාරි 01 දිනට පෙර වලංගු බලපත්‍රයක් ලබාගෙන ඇති දැනට සිටින ක්‍රියාත්මක තත්ත්වයේ තැනැත්තන් | රුපියල් බිලියන දෙකක්<br><br>(පළමු වසර පහ සඳහා - රුපියල් මිලියන පන්සියයක්;<br><br>ඉදිරි වසර පහළොව සඳහා - රුපියල් බිලියන එකක් සහ මිලියන පන්සියයක්) | රුපියල් බිලියන දහයක් |

,,

EOG 01 - 0144

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.